# ගාලු වරායේ ඓතිහාසික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

**එල්.කේ. වීරප්පෙරුම[1]**

මුඛ්‍ය පදඃ ඓතිහාසික, ගාලු වරාය, ජාත්‍යයන්තර, මූලාශ්‍ර, වෙළඳාම

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළ තීරයේ පිහිටා ඇති ගාලු වරාය ඉන්දියන් සාගර කලාපයේ පැරණිතම සහ ඓතිහාසික වශයෙන් වැදගත් වරායන්ගෙන් එකකි. ආරක්ෂිත භූමි ප්‍රමාණයන්ගෙන් වට වූ මෙම වරායේ ස්වාභාවික වරාය සහස්‍ර දෙකකට වැඩි කාලයක් ලොව පුරා වෙළඳුන් සහ සමුද්‍රීය නැව් සඳහා තීරණාත්මක නැවතුම්පොළක් ලෙස සේවය කර ඇත. දකුණු ආසියාව, අප්‍රිකාව සහ මැද පෙරදිග අතර කුළුබඩු, මැණික් සහ රෙදිපිළි වැනි වටිනා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පහසුකම් සපයන ගෝලීය වෙළඳාමේ මධ්‍යස්ථානයක් ලෙස වරාය සේවය කර ඇත. එහි උපාය මාර්ගික වැදගත්කම පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍යයන් යන යටත් විජිත බලවතුන් විසින් හඳුනා ගන්නා ලදී. ගාල්ල ඔවුන්ගේ වෙළඳ මාර්ග සඳහා මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කළහ. ගාලු වරායේ ඓතිහාසික පසුබිම කෙබඳු වේද? යන අධ්‍යයනය ගැටලුව මෙම අධ්‍යයනය සඳහා මූලික වී ඇත. ගාලු වරායේ ඓතිහාසික වැදගත්කම නගරයේ ගෘහ නිර්මාණ ශිල්පය සහ පිරිසැලසුම තුළින් පිළිබිඹු වන අතර එය අදටත් යුනෙස්කෝ ලෝක උරුම අඩවියක් ලෙස පවතී. මෙහිදී උක්ත ගැටලුවට අනුව මූලාශ්‍ර හා සාහිත්‍යය විමර්ශණය ඇසුරින් ගාලු වරායේ ඓතිහාසික වටිනාකම හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු වී ඇත.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය බහුවිධ ප්‍රවේශයක් යටතේ සිදු කර ඇත. ඒ අනුව මේ සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීමේදී ක්ෂේත්‍ර නොවන මූලාශ්‍ර අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන වශයෙන් භාවිත වන්නට විය. ක්ෂේත්‍ර නොවන මූලාශ්‍ර අධ්‍යයනයේදී යටත් විජිත වාර්තා, සිතියම්, ඓතිහාසික මූලාශ්‍ර, සංචාරක සටහන් ආදිය ඇතුළත් විය. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ විශේෂයෙන් ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය හා ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය හරහා ගාලු වරායෙහි ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම් පිළිබඳව තොරතුරු බොහොමයක් එක් රැස් කර ගන්නට විය. එමෙන්ම අන්තර්ජාලය හරහාද ඇතැම් තොරතුරු ලබා ගැනීමට හැකි වූ අතර එම සියලු තොරතුරු මත පදනම්ව ගාලු වරායෙහි ඓතිහාසික පසුබිම පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහිදී සිදු විය.

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
lakshikakavindya98@gmail.com

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පෙර අපර දෙදිග යා කරන නැව් මාර්ගයට යාබදව පිහිටි හෙයින්ද ලොව ප්‍රකට වරාය නගරයක් වූ හෙයින්ද අතීතයේ සිටම ගාල්ල දෙස් විදෙස් සංචාරකයන්ගේ නොමද ආකර්ෂණයට ලක්වී ඇති බව පෙනී යයි. ගාල්ලෙහි ඉතිහාසය ගත් කළ ගාලු වරායේ ඉතිහාසයම වන බව පැහැදිලිය. ඒ අනුව ගාලු වරාය හේතුවෙන් ගාලු නගරයද ගාලු නගරය හේතුවෙන් ගාලු වරායද වරිනාකමින් වැඩි වී ඇති බවක් සඳහන් කළ හැකිය. ගාලු වරායෙහි ඓතිහාසික වැදගත්කම විමසීමේ දී මේ පිළිබඳව තොරතුරු හිමිවන ඓතිහාසික මූලාශ්‍ර වෙතට අවධානය යොමු කිරීම ඉතා වැදගත් වනු ඇත. ඒ අනුව වංශකථා, සංදේශ කාව්‍යයන් හා දේශාටන වාර්තා ආදිය එහිදී ප්‍රධාන තැනක් හිමිකර ගනු ඇත.

ගාලු වරාය පිළිබඳ මහාවංශයේ සඳහන් වනුයේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ (1164-1197) රාජ්‍ය කාලයේ සිටය. මහා පරාක්‍රමබාහු රජතුමාට විරුද්ධව සුගලා දේවිය ගාලු නදී මුවදොර බලකොටු බැඳි බවත් මහා පරාක්‍රමයබාහු රජතුමාගේ සේනාවෝ ඒවා විනාශ කළ බවත් මහාවංශයේ සඳහන් වේ (ඩේවිඩ්, 2021,203). ශ්‍රීමත් එමර්සන් ටෙනන්ට් ඉතා පුරාණ කාලයේ සිට ගාලු වරාය පැවැති බව සඳහන් කරන අතර බයිබලයේ පැරණි තෙස්තමේන්තුව ආදී පැරැණි හීබෲ පොත්වල සඳහන් කුලහ හෙවත් ටාර්ශිෂ් යන නැව්තොට ගාල්ල වරාය බව ඔහුගේ අදහසයි (ඩේවිඩ්, 2021,103).

ගාලු වරාය සම්බන්ධයෙන් පරම්පරා පුස්තකය නම් ඉන්දීය ඉතිහාස පොතේ සඳහන් වන බව මහාචාර්ය පරණවිතාන විසින් උපුටා දක්වයි. ඉන්දියාවේ ශක ජනයින්ගේ කණ්ඩායමක් එහි සිටී. යවන (ග්‍රීක්) ජනයා සමග කළ යුද්ධයෙන් පරාජය වූ බවත් ඉන්පසු සින්ධු නදියේ මුව දොරට විත් එතනින් නැව් නැග ලංකාවට ළඟා වී ගාලු පටුනේ ගොඩ බැසි බවත් එහි සඳහන් වේ. (ඩේවිඩ්, 2021,104).

ගාලු වරාය ජාත්‍යන්තර වෙළඳාමට වැදගත් වූ බවට පෙන්වා දිය හැකි හොඳම නිදසුන වන්නේ 15 වන සියවසේ දී ලියන ලද ත්‍රෛභාෂා සෙල්ලිපියයි. ලෝකයේ විවිධ ප්‍රදේශවලින් ගාලු වරායට පැමිණි වෙළඳ සමූහයන් පිළිබඳව තොරතුරු මෙම ලිපියෙහි පරිවර්තනය මගින් අනාවරණය කොටගෙන ඇත. පුරාණයේදී ශ්‍රී ලංකාව සමඟ ගනුදෙනු කරන ලද්දේ චීන, පර්සියානු, ග්‍රීක්, මිසර හා අරාබි ජාතිකයන්ය. එහිදී ඔවුන් වැඩි වශයෙන් ලංකාවට පැමිණීමට භාවිතා කර ඇත්තේ මන්නාරම හා ත්‍රිකුණාමලය යන වරායන් ද්විත්වයයි. 12 වන සියවසෙන් පසුව ක්‍රමයෙන් ගාලු වරාය ජනප්‍රියත්වයට පත්වීමත් සමඟ විදේශිකයන්ගේ අවධානය ගාලු වරාය කෙරෙහිද යොමු වන්නට විය. ගාලු වරාය ආශ්‍රිත මුල්ම වෙළෙන්දන් වශයෙන් හඳුනාගෙන ඇත්තේ අරාබි ජාතිකයන්ය.

වර්ෂ 1505 දී ගාලු වරායට පැමිණි පෘතුගීසිහු ලංකාවේ වෙළඳාම ඉතා සරුවට පවත්වන්නට වූ අතර ඔවුන් ගාලු වරාය සිය ආර්ථික මධ්‍යස්ථානය වශයෙන් භාවිතා කරන්නට ඇති බව සඳහන් කළ හැකිය. පෘතුගීසීන් සතුව තිබූ ගාලු වරාය

හා කොටුව 1940 දී ලන්දේසීන් අල්ලා ගැනීමට සමත් විය. එවකට ලංකාවේ පැවති විශාලතම වරාය වූයේ ගාලු වරායයි. ලන්දේසීන් විසින් ආක්‍රමණය කරන ලද ස්ථාන අතුරින් ඉතාම වැදගත් ස්ථානය ලෙස ගාලු වරාය සැලකූ ඔවුන් එය තම ප්‍රධාන පාලන මධ්‍යස්ථානය බවටද පත්කර ගනු ලැබීය.

ලන්දේසීන්ගෙන් පසුව බ්‍රිතාන්‍ය හමුදාවේ 70 වෙනි රෙජිමේන්තුවේ කැප්ටන් ලොක්ලන් මැකවරි විසින් කිසිදු සටහනකින් තොරව 1796.02.23 දින ගාල්ල බ්‍රිතාන්‍ය පාලනයට පවරාගෙන ඇති බව සඳහන් වේ. එතැන් සිට දීර්ඝ කාලයක් ලංකාවේ ප්‍රධාන වරාය වශයෙන් ක්‍රියාත්මකව පැවතියේ ගාලු වරායයි. එවකට ගාලු වරාය දැඩි කාර්ය බහුලත්වයකින් යුක්ත විය. පිටරටින් මෙරටට පැමිණෙන්නෝද මෙරටින් පිටරටට යන්නෝද භාවිතා කරන්නට වූයේ ගාලු වරායයි. බොහෝ අවස්ථාවල වරාය පුරා නැව් නවතා තිබීම එකල සුලභ දසුනක් වී ඇත. යුරෝපයේ සිට ඕස්ට්‍රේලියාවට සහ ඈත පෙරදිග රටවලට ගමන් කළ මගීන්ට ගාලු වරාය හොඳ නවාතැන්පොළක් බවටද පත්වී පැවතුණි.

## සමාලෝචනය

ක්‍රි.පූ. කාලවල සිටම වරායක් ලෙසට භාවිතා කළද ගාලු වරාය වඩා ක්‍රියාකාරී වූයේ 12 වන සියවසෙන් පසුවය.1873 දී කොළඹ කෘත්‍රිම වරාය ඉදිවන තෙක්ම ගාලු වරාය සියවස් ගණනාවක්ම මෙරට ප්‍රධාන වරාය වශයෙන් පැවතුණි. ලන්දේසි යුගයේ ලන්දේසි පෙරදිග ඉන්දිය වෙළඳ සමාගම (VOC) යටතේ පාලනය වූ ආසියාවේ වරායවල් අතුරින් ගාලු වරාය දෙවැනි වූයේ බතාවියට පමණක් වීමද විශේෂයකි. ඒ පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක ගාලු වරාය තුළ අදටත් ශේෂව පවතිනු ඇත.

## ආශ්‍රිත මූලාශ්‍රය


ගාමිණී, ජී.එල්. (2007). ***පුරාණ ලංකාවේ වරායන්.*** කොළඹ 10: සූරිය ප්‍රකාශකයෝ.

ඩේවිඩ්, කේ.එම්, (2021). ***ගාල්ල.*** ගාල්ල: වනජීවී සංරක්ෂණ සංගමය.

විලියම්, ජී.වී.ජී, (1966). ***ගාලු ඉතිහාසය.*** කර්තෘ ප්‍රකාශන.